State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

# G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

# අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

## History

## ඉතිහාසය

# (QUESTION PAPER) - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

| අ.පො.ස.(සා / පෙළ) විභාගය –2020 | |
|---|---|
| **ආදර්ශ ප්‍රශ්න පත්‍රය** | |
| **II පත්‍රය** | |
| **ඉතිහාසය** | **කාලය පැය තුනයි** |

* **I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්යය වේ.**
* **II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**
* **පිළිතුරු සිපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

**I කොටස**

**01.** (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් තෙකාටසෙහි ද ලකුණු කර නම් කරන්න

(i) මැණික් ගඟ, වනවාහිනී නදී, යෝධ වැව, ලංකා පටුන, නල්ලූරු කෝවිල, පේදුරු තුඩුව, සෙංකඩගල, කාචර ගාම, පුලතිසිපුර, කල් පිටිය අර්ධද්වීපය, ගෝකණ්ණ, කොළඹ

(ලකුණු 12 යි)

(ii) මලයාව, කළු මුහුද, ඉස්තාම්බුල්, ජාවා, ඉතාලි අර්ධද්වීපය, ගෝව

(ලකුණු 06 යි)

(අ) (i) පහත A, B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. ක්‍රි.ව. 1505 දී ලංකාවට පැමිණි පළමු පෘතුගීසි ජාතිකයා

B. ක්‍රි.ව. 1255 දී කාලිංග මාඝ පරාජය කළ මෙරට රජතුමා


C. එකසත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානය පිහිටි රට

D. දෙවන ලෝක යුධ සමයේ ජර්මනියේ සිටි පලකයා

(ලකුණු 04යි)

* **A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(ii) 1. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?
2. එම පුද්ගලයා අයතුවන රාජධානිය කුමක් ද?
3. මෙම පිළිරුව දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?
4. එම ස්ථානයේ දක්නට ලැබෙන තවත් පාලකයෙකු සඳහන් කරන්න.



A රූපය

(iii) 1. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක් ද?
2. එය තැනීමට යොදා ගෙන ඇත්තේ නෙවා ද?
3. මෙය දක්නට ලැබෙන්නේ කුමන ගංගාව ආශ්‍රිතව ද?
4. මෙය කුමන රාජධානි සමයට අයත් ද?



B රූපය

## II කොටස

**02**

(i) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ දක්නට ලැබුණු ගම්වල ජීවත් වූ පුද්ගලයන් කුමන වෘත්තියකට අයත් දැයි ඉදිරියෙන් ලියා දක්වන්න.

a. කේවට්ටගාම

b. කසිකාරගාම

c. වඩ්ඪකීගාම

(ලකුණු 03 යි)

(ii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක හතරක් නම් කරන්න

(ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න

(ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයෙ ජීවත් වූ මිනිසා දියුණු තාක්ෂණයක් වෙත යොමු වී සිටි ආකාරය කරුණු 03 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06යි)

**03**

(i) පහත කරුණුවලට අදාල බදුවර්ග වරහන් තුළින් තෝරා ලියන්න.

a. රජුගේ ඉඩම් පරිහරණය වෙනුවෙන්

b. ඇළ මාර්ගවල මසුන් අල්ලන අය වෙනුවෙන්

c. රජුගේ වැව්වල ජලය සපයාගත් අය වෙනුවෙන්

( දකපති, බොජකපති, මතරමජික )

(ලකුණු 03 යි)

(i) පහත සඳහන් කරුණුවලට අදාල පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

(ii)

a. ශ්‍රී ලංකාව රතු කැට දිවයින ලෙස හැඳින් වූ පාලකයා

b. පත්තිනි දේවාලයෙක් විවෘත කිරීමට ඉන්දියාවේ චේර රාජ්‍යයට ගිය පාලකයා

c. බදුලු ටැම් ලිපිය කරවූ පාලකයා

d. කෝරල වරුන්ගෙන් ගොඩනැගූ අගම්පොඩි සේනාව යොදාගත් පාලකයා

**( I ගජබාහු රජු / අල් - බලසූරි රජු / ඉලනාග රජු / iv උදය රජු)**

(ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ අතීත ආර්ථිකයේ පැවති ප්‍රධාන ලක්ෂණ දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍යයත්ව සංකල්පය බලවත් වීමේ දී රජගේ වගකීම හා කාර්යයභාරයන් තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න

(ලකුණු 06 යි)

**04**

(i) පහත වැව් ගොඩනැගී ඇති ගංගාව වරහන් තුළින් තෝරා ලියන්න

a. ඉරණමඩු වැව
b. තබ්බෝව වැව
c. හුරුළු වැව

**(මල්වතු ඔය / මී ඔය / කනගරායන් ආරු / කලා ඔය / යාන් ඔය )**

(ලකුණු 03 යි)

(ii) පහත වැව් හා ඇල මාර්ග ඉදි කළ රජවරු නම් කරන්න

a. මහකනදරා වැව
b. මහවිලච්චිය වැව
c. යෝධ ඇළ
d. ඇළහර ඇළ

(ලකුණු 04 යි)

(iii) ලංකාවේ ප්‍රථම වැව ඉදිකරමින් අනුරාධපුරය ගොඩ නැගූ පණ්ඩුකාභය රජුගේ කාර්යභාරය කරුණු 02 ක් යටතේ විස්තර කරන්න.

(iv) අතීත රජවරු වැවක් නිර්මාණය කිරීමේ දී යොදාගත් තාක්ෂණික ලක්ෂණ කරුණු 03 ක් යටතේ විස්තර කරන්න.

**05**

(i) පෘතුගීසින් ලංකාවට පැමිණීම හා සම්බන්ධ පහත කරුණුවලට අදාල පුද්ගලයන් නිවැරදිව වරහන් තුළින් තෝරාන්න.

a. ක්‍රි. ව. 1505 දී පෘතුගීසින් පැමිණෙන විට උඩරට සිටි පාලකයා
b. මුල්ලේරියා සමගින් පෘතුගීසීන් පරාජය කල පාලකයා
c. පෘතුගීසීන්ට එරෙහිව කැලිකට්හි සැමොරින්ගේ ආධාර ලබා ගත් සීතාවක පාලකයා

(ලකුණු 03 යි)

**( VIII වන වීර පරාක්‍රමබාහු රජු / සේනාසම්මත වික්‍රමබාහු රජු / මායාදුන්නේ රජු / ටිකිරි කුමරු )**

(ii) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන සමය ඇසුරින් පහ කරුණුවලට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

a. මෙරට රජවරු සමඟ මුලින්ම ගිවිසුමකට එළඹි ලන්දේසි නායකයා
b. ක්‍රි. ව. 1766 ගිවිසුමට අත්සන් තැබූ මෙරට පාකයා
c. ලන්දේසි සමයේ ත්‍රී සිංහලාධීශ්වර විරුධය භාවිත කල පාලකයා
d. ක්‍රි. ව. 1602 දී ලංකාවට පැමිණි පලමු ලන්දේසි ජාතිකයා

**(II රාජසිංහ / ජොරිස් වෑන් ස්පිල්බර්ජන් / වෙස්ටර් වෝල්ඩ් / කීර්ති ශ්‍රී රාජසිංහ / ජෝන් ෆයිබස්)**

(ලකුණු 04 යි)

(iii) ලන්දේසි සමයේ මෙරට ආර්ථිකයේ ඇති වූ දියුණුව කරුණු 02 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට උඩරට රාජධානිය යටත්කර ගැනීමට නොහැකි වූ හේතු තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)

**06**

(i) කන්ද උඩරට රාජධානිය හැඳින් වූ වෙනත් නම් 03 ක් ලියන්න.

(ලකුණු 03 යි)

(ii) කන්ද උඩරට රාජධානිය පාලනය කළ සිංහල රජවරු දෙදෙනෙක් හා නායක්කාර් වංශික රජවරු දෙදෙනෙක් පිළිවෙළින් ලියන්න.

(ලකුණු 04 යි)

(iii) උඩරට රාජධානියේ දක්නට ලැබුණු සමාජයමය ලක්ෂණ 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iv) උඩරට රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයෙකු ලෙස I වන විමලධර්ම සූරිය රජුගේ සේවාවන් 03 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)

**07**

(i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය ඇසුරින් පිළිතුරු සපයන්න.

a. බ්‍රිතාන්‍යයන් මුහුදුබඩ තීරයේ බලය හිමිකර සමයේ උඩරට සිටි පාලකයා

b. 1815 උඩරට ගිවිසුම අත්සන් කළ සමයේ බ්‍රිතාන්‍යයේ සිටි පාලකයා

c. මෙරට පැවති රාජකාරි ක්‍රමය මුලින්ම අවලංගගු කල ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

(ලකුණු 03 යි)

(ii) පහත කරුණුවලට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

a. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත් අඩංගුවට පත් වූ ප්‍රදේශය

b. බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රථම ප්‍රහාරය එල්ල වූ මෙරට වරාය

c. 1818 අරගලයට ආසන්නම හේතුව හා සම්බන්ධ ප්‍රදේශය

d. 1848 අරගලය ආරම්භ වූ ප්‍රදේශය

(ත්‍රිකුණාමලය / මැද මහනුවර / මාතලේ / ඌව වෙල්ලස්ස)

(ලකුණු 04 යි)

(iii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමත් සමඟ මෙරට වතුවගාව දියුණු වූ අතර වතුවගාව නිසා මෙරට ආර්ථිකයේ ඇති වූ යහපත් ප්‍රතිඵල 02 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) 1818 අරගලයෙන් වසර 30කට පසු මෙරට ගොවිජනතාව නිදහස් අරගලයක් වෙත යොමු වීමට බලපෑ හේතු 03 ක් විස්තර කරන්න.

(ලකුණු 06 යි)

## II කොටස

**08**

(i) යුරෝපයේ පුනරුද සමයේ සිදු වූ දේශ ගවේෂණ ව්‍යාපාරය තුළ දී පහත සඳහන් දේශ ගවේෂකයන් සොයා ගිය රටවල් වරහන් තුළින් තෝරා ලියන්න.

a. ෆර්ඩිනන්ඩ් මැගලන්

b. වස්කෝ ද ගාමා

c. ක්‍රිස්ටෝෆර් කොලම්බස්

**(ශ්‍රී ලංකාව / ඉන්දියාව / හස් පැණියෝලාව / පිලිපීනය)**

(ලකුණු 03 යි)

(ii) යුරෝපයේ පුනරුදය ඇසුරෙන් පහත සිදුවීම්වලට අදාල පුද්ගලයින් වරහන් තුළින් තෝරා ලියන්න.

a. සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ චිත්‍ර ඇඳීම

b. ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු සෙවීම

c. මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

d. ආගමික ප්‍රතිසංස්කරණයට නායකත්වය දීම

**(පැරසල්සස් / මයිකල් ඇන්ජිලෝ / ලියනාඩෝ ඩාවින්චි / මාටින් ලූතර් / ජොහැන්නස් ගුටෙන්බර්ග් / විලියම් හාවේ)**

(ලකුණු 04 යි)

(iii) යුරෝපයේ දේශ ගවේෂණ ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ හේතු 02 ක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iv) යුරෝපයේ පුනරුදය ලංකාව කෙරෙහි ඇතිකළ සමාජ සංස්කෘතික බලපෑම් කරුණු 03 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06 යි)

**09**

(i) ඇමරිකන් විප්ලවයේ දී ජනතාව පීඩනයට පත් කරමින් පැන වූ නව පනත් තුන නම් කරන්න.

(ලකුණු 03 යි)

(ii) ඇමරිකන් , ප්‍රංශ හා රුසියන් විප්ලව ඇසුරෙන් පහත ඒවාට පිළිතුරු සපයන්න.

a. ඇමරිකන් ජනපදවලින් බදු අයකිරීම ක්‍රමවත් කළ බ්‍රිතාන්‍ය අගමැතිවරයා

b. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා

c. "සමාජ සම්මුතිය" නම් කෘතිය රචනා කළ කතුවරයා

d. සෝවියට් රුසියාවේ ප්‍රථම සමාජවාදී නායකයා

**( ජෝර්ජ් වොෂින්ටන් / රූසෝ / ජෝර්ජ් ග්‍රෙන්විල් / ලියෝන් ට්‍රොට්ස්කි / වී. අයි. ලෙනින් )**


(ලකුණු 04 යි)

(iii) ඇමරිකන් නිදහස් සටනට බලපෑ ආර්ථික ප්‍රතිපත්ති 02 ක් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) ප්‍රංශ විප්ලවයට තුඩුදුන් දේශපාලන හේතු 03 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)


ශ්‍රී ලංකාව

